**පළාත් පාලන සේවා වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල**

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 1.2 ජේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2011 දෙසැම්බර් 31 දිනට පළාත් පාලන සේවා වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාර්ත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

1.2.1 **ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය තුලදී ගෙවන ලද වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුපෙන් අයකළ සහ අරමුදලට සෘජු ලෙස ලැබී තිබුණ එකතුව රු.35,362 ක් විධිමත් පරිදි හඳුනාගෙන ගිණුම් ගත කිරීමෙන් තොරව වෙනත් ලැබීම් ලෙස ආදායම් වියදම් ගිණුමේ දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ අවස්ථා 05 ක එකතුව රු.540,153 ක ලැබීම්, මුදල් පොතේ දෙවරක් සටහන් වීම නිවැරදි කිරීමේදී අදාල ගිණුම් හඳුනාගෙන හර කිරීම වෙනුවට වෙනත් ගෙවීම් ලෙස ආදායම් වියදම් ගිණුමේ දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ සමස්ථ විශ්‍රාම වැටුප් වියදම ගණනය කර මූල්‍ය ප්‍රකාශනවල ගලපා නොතිබුණි. විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු පරිඝනක දත්ත පද්ධතියේ වියදම් වර්ගීකරණයට අනුව සමාලෝචිත වර්ෂයේ අරමුදලේ සමස්ථ විශ්‍රාම වැටුප් වියදම රු.528,509,419 ක් වී තිබුණි.

## 1.2.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) වසර ගණනාවක සිට ඉදිරියට ගෙන එමින් පවතින රු.3,417,942 ක්වූ අගරුවූ චෙක්පත් ගිණුමේ ශේෂය නිරවුල් කිරීමට හෝ ඒ සඳහා මුදල් ගෙන්වා ගැනීමට සමාලෝචිත වර්ෂය තුලදීද කටයුතු කර නොතිබුණි.

(ආ) බැංකු සැසඳුම් ප්‍රකාශය අනුව 2011 දෙසැම්බර් 31 දිනට හඳුනා නොගත් ලැබීම් රු.150,476ක් මූල්‍ය ප්‍රකාශනවල ලැබිය යුතු මුදල් ලෙස දක්වා නොතිබුණි.

## 1.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති පහත සඳහන් එක් එක් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

| | විෂයය | වටිනාකම<br>රු. | | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|---|---|
| (I) | දායක මුදල් ලැබීම් | 295,141 | (I) | කාල ක්‍රමානුගත පිළිවෙලට නඩත්තු කළ ලේඛනයක් |
| | | | (II) | දායක මුදල් ලැබී ඇති ආයතන පිළිබඳ ලේඛනයක් |
| | | | (III) | අවකරණ ලේඛන |
| (II) | අගරුවූ චෙක්පත් ගිණුම | 3,417,942 | | අගරු වූ චෙක්පත් ලේඛනය |

(ආ) අක්‍රීය කර තිබූ බැංකු ගිණුමක 2002 ජනවාරි 31 දිනට බැංකු සැසඳුම අනුව දැක්වෙන පහත සඳහන් ශේෂයන් නිරවුල් කළ ආකාරය විගණනයට ඉදිරිපත් නොවීය.

| විස්තරය | මුදල |
|---|---|
| | රු. |
| නිරවුල් නොවු ගෙවීම් | 5,948,929 |
| නිරවල් නොවු ලැබීම් | 24,929,420 |
| හඳුනානොගත් ගෙවීම් | 1,649,845 |
| හඳුනානොගත් ලැබීම් | 53,921,123 |

### 1.2.4 නීති, රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකුල නොවීම

පහත සඳහන් නීති, රීති , රෙගුලාස යනාදියට අනුකුල නොවීම් අවස්ථා නිරීක්ෂණය විය.

| | නීති,රීති රෙගුලාසි යනාදියට යොමුව | අනුකුල නොවීම |
|---|---|---|
| (අ) | 1985 අංක 10 දරන පනතින් සංශෝධිත ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 16 දරන පළාත් පාලන සේවා පනතේ 23 වන වගන්තිය යටතේ පළාත් පාලන, නිවාස හා ඉදිකිරීම් අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝගවල අංක 5 (2) නියෝගය | උක්ත නියෝගය ප්‍රකාරව කටයුතු කිරීමෙන් තොරව අරමුදලේ ගෙවීම් සඳහා මුළුමනින්ම විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ ප්‍රතිපාදන උපයෝගී කරගෙන තිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි | |
| | (I) මු.රෙ. 189 හා 486 | අගරු වූ චෙක්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| | (II) මු.රෙ. 143 (3) (ආ) | 2011 දෙසැම්බර් 31 දිනට පැවති තැන්පත් කළ නමුත් උපලබ්ධිනොවු රු.39,807 ක වටිනාකමකින් යුත් තැන්පතු 03 ක් මදල් රෙගුලාසි ප්‍රකාර නිරවුල් කරවා ගැනීමට කටයුතු කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ඇ) | 2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ්/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ | |
| | (I) 4.1(අ) ඡේදය | සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනය විෂයභාර අමාත්‍යවරයා විසින් අනුමත කර නොතිබුණි. |
| | (I) 4.3(ඇ) ඡේදය | සමාලෝචිත වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඇ) | 2010 දෙසැම්බර් 13 දිනැති අංක 12/2010 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛයේ 2(IV) ඡේදය | අරමුදලේ මාසික වියදම් පිළිබඳ ඒකාබද්ධ වාර්තා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත ගෙන්වාගෙන නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා අරමුදලේ මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵලය රු.14,182,561 ක අතිරික්තයක් වු අතර , ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.3,967,150 ක් වුයෙන් ඉකුත් වර්ෂය හා සසඳන විට මූල්‍ය ප්‍රතිඵලයේ රු.10,215,411 ක වර්ධනයක් පෙන්නුම් කෙරිණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ වෙනත් ලැබීම් රු.3,851,105 කින් අඩුවී භාණ්ඩාගාර බැඳුම්කර පොලී ආදායම රු.3,814,387 කින් වැඩිවී තිබුණද, වියදම් රු.11,484,897 කින් අඩුවීම මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනයට ප්‍රධාන වශයෙන් ඉවහල්වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 16 දරන පළාත් පාලන සේවා පනතේ 18 වගන්තිය ප්‍රකාරව උක්ත අරමුදලේ පාලනය විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්වරයා සතු බව සඳහන්ව ඇතත් පනතේ නියෝගයන්ට පටහැනිව 2010 දෙසැම්බර් 13 දිනැති අංක 12/2010 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛය මගින් අරමුදලේ මාසික වැටුප් ලේඛන පිළියෙල කිරීම හා ලිපි ගොනු භාරකාරත්වය 2011 ජනවාරි 01 දින සිට ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත විමධ්‍යගත කර තිබුණි.

### 3.2 <u>මූල්‍ය කළමනාකරණ දුර්වලතා</u>

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත්කර තිබුණු සටහන් අනුව සමාලෝචිත වර්ෂයේ අරමුදලේ විශ්‍රාම වැටුප, විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු වැය ශීර්ෂය මගින් ගෙවා තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ අරමුදලේ පොලී ආදායම වූ රුපියල් මිලියන 13.1 ක් අරමුදලේ විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා උපයෝජනය කිරීමෙන් තොරව ආයෝජනය කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ ජනවාරි සිට අප්‍රේල් මාසය දක්වා රුපියල් මිලියන1.9 ක හා ජූලි සිට ඔක්තෝබර් දක්වා රුපියල් මිලියන1.3 ක අතිරික්ත මුදලක් ආයෝජනය කිරීමෙන් තොරව නිෂ්කාර්යව රඳවාගෙන තිබුණි.

(ඇ) අරමුදල සතු අතිරික්ත මුදල් ආයෝජනය කිරීමේදී 2008 මාර්තු 03 දිනැති අංක 1/2008 දරන භාණ්ඩාගාර මෙහෙයුම් චක්‍රලේඛයෙන් අනුමතකර ඇති ආයෝජන මූලාශ්‍ර වන ස්ථාවර තැන්පතු හා භාණ්ඩාගාර බැඳුම්කරවල අපේක්ෂිත ප්‍රතිලාභ ඇගයීමෙන් අරමුදලට වාසිදායී ආයෝජන තීරණය කිරීම කෙරෙහි අවධානය යොමු නොකර රුපියල් මිලියන 16.4 ක් භාණ්ඩාගාර බැඳුම්කරවල ආයෝජනය කර තිබුණි.

## 4. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ අඩු පාඩු පිළිබඳව වරින් වර විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්වරයා දැනුවත් කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළයුතු වේ.

(අ) බැංකු සැසඳුම් පිළියෙල කිරීම

(ආ) විශ්‍රාම වැටුප් ගෙවීම්

(ඇ) ආයෝජන